**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2019**

**------------------------------------------------------------------------**

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව අතර 2012 මැයි 18 දින එළඹි අංක 8145 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ II වගන්තිය (ආ.3) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ කොළඹ මහනගර සභාව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. කොළඹ ජල ද්‍රෝණිය පෝෂක ප්‍රදේශයේ ජලගැල්ම අඩුකිරීම, කොළඹ අගනගරයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සහ තෝරාගත් ආදර්ශන ආයෝජනයන් මඟින් ප්‍රාදේශිය යටිතල හා සේවා වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 42,031.74 කට සමාන එ.ජ.ඩො. මිලියන 321 ක් වන අතර ඉන් රු.මිලියන 27,890.22 කට සමාන එ.ජ.ඩො මිලියන 213 ක් මුල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 14,141.52 ක් ශ්‍රී ලංකා රජය මගින් මුල්‍යානය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජුලි 10 දින ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිම කිරිමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත් ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2021 දෙසැම්බර් 31 දක්වා දිර්ඝකර තිබුණි.

### 1.3 මතය

**------**

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------**

මෙම මුල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මුල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් , ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදි එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනිමේදි හා තක්සේරු කිරීමේදි අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී .මාගේ විගණනය තුළදි හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

| | විගණන ඡේදය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කෙරෙන උප ව්‍යාපෘතින් සඳහා ලැබී තිබුණු ආධාරමුදල් රු. | විදේශිය ණය මුදල් වටිනාකම රු.10,000,000 කින් මූල්‍ය ප්‍රකාශනවල | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. | ගිණුම්කරණ අඩුපාඩු , මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 10,000,000 ක් වැඩියෙන් සටහන් කිරීම නිසා ලෝක බැංකු ණය ගිණුම හා ණය අත්තිකාරම් ගිණුම යන ගිණුම් දෙකෙහි ශේෂය රු.10,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වැඩියෙන් දක්වා තිබීම. | ජනල් සටහහන් ගිණුම්ගත කිරිමේදී මෙම වරද සිදුවී තිබේ. | |
| (ආ) | මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා භාණ්ඩාගාරයෙන් දරනු ලබන වියදම භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රු.1,625,309,323 ක් වුවද එය ව්‍යාපෘතියේ ශ්‍රී ලංකා භාණ්ඩාගාර අරමුදල් උපයෝජන (GOSL Funds) ගිණුමේ රු.1,613,000,000 ක් ලෙස රු.12,309,823 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | මහාභාණ්ඩාගාරයෙන් ව්‍යාපෘතිය සඳහා ලද මුදල් රු.12,309,823 ක් ගිණුම් තුල අඩුවෙන් සටහන් කිරීම. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමේ ක්‍රියාවලියේ තිබුණු අඩුපාඩුවක් නිසා මෙම අඩුපාඩුව සිදුවී තිබුණි. 2020 ගිණුම්තුල නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | මහාභාණ්ඩාගාරයෙන් ලද මුදල් නිවැරදිව සැසදීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ සංරචක 02 හි සංවර්ධන වියදම් යටතේ වන ඉදිකිරීම් උපදේශන සේවා ගාස්තු රු. 267,454,113 ක වටිනාකමක් දක්වා තිබුණත් ඒ සම්බන්ධයෙන් සපයා තිබුණේ රු. 259,966,508 ක උපලේඛනයකි. ඒ අනුව සපයා තිබුණු උපලේඛනය රු. 7,487,605 කින නොසැසදී තිබුණි. | උපදේශන සේවා වියදම සඳහා ලබාදී තිබුණු උපලේඛණය මූල්‍ය ප්‍රකාශන සමඟ නොසැසදීම. | ගිණුමේ සඳහන් මුදල නිවැරදි නමුත් උපලේඛනය යාවත්කාලීන නොවීම නිසා මෙම අඩුපාඩුව සිදුවී තිබුණි. | ගිණුමේ සඳහන් වටිනාකම් සහ උපලේඛන නිවැරදිව සැසදීම් කල යුතුය. |

**2.2 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීතිරීති රෙගුලාසි වලට යොමුව | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | -------------- | ------------------ | --------------- | -------------- | ------------------ |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) | මු.රෙ. 757 (2) (අ) (ආ) | 2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ සඳහන් නිර්දේශ අනුව ක්‍රියාකර නොතිබුණි. | ව්‍යාපෘතියේ ඉන්වෙන්ට්‍රි පාලන පද්ධතිය අක්‍රමවත්වීම නිසා වත්කම්වල ආරක්‍ෂාව තහවුරු නොවීම. | නිර්දේශ සම්බන්ධව ක්‍රියාකිරිමට කටයුතු යොදා ඇත. වාර්තා පසුව ඉදිරිපත් කරනු ලැබේ. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර ඉන්වෙන්ට්‍රි පාලනය ශක්තිමත් කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | මු.රෙ. 751 | • ව්‍යාපෘතියේ RTC (Real Time Flood Control) උප ව්‍යාපෘති කාර්යාලය විසින් භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ඉන්වෙන්ට්‍රි පාලන පද්ධතිය අක්‍රමවත්වීම නිසා වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම. | මේ සඳහා නිලධාරියෙකු පත්කර අවශය උපදෙස් ලබාදී ඇත. | කාර්යාලය වෙත ලැබෙන සියළු භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයක් තුල නිවැරදිව ඇතුලත් කල යුතුය. |
| | | • ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා කාර්යාලය වෙත නිකුත් කරන ලද කැබිනට් 4 ක් අදාල ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුලත් කර නොතිබුණි. | නිවැරදිව ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනගත නොවීම වත්කම් පාලනය පිළිබඳ බලපෑමක් ඇති කරයි. | වර්තමානයේදී අදාල අයිතම ඉන්වෙන්ට්‍රි ගත කිරීමට කටයුතු කර ඇත. | ඉන්වෙන්ට්‍රි ලේඛන නිවැරදිව යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුයි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය | සෙත්සිරිපාය II වන අදියර ගොඩනැගිල්ලේ 13 වන මහලේ කොටසක් බෙදා වෙන්කර ගැනීම සඳහා 2018 වර්ෂයේදී රු.1,726,985 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුනු නමුත් අදාල ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | කොන්ත්‍රාත් පාලන ක්‍රියාවලියෙන් බැහැර වීම. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතිය විසින් සෑම ප්‍රසම්පාදන කටයුත්තකදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුගත විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික හා මූල්‍ය කාර්යසාධනය**

| | උප ව්‍යාපෘති/සංරචක | 2019.12.31 දිනට ඉලක්කගත භෞතික කාර්යසාධනය | අරමුණු කරා ලගාවීම භෞතික | අරමුණු කරා ලගාවීම මූල්‍ය | ප්‍රමාදය/විගණන නිරීක්ෂණ | බලපෑම | විගණන නිර්දේශය | කළමනාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|---|---|---|
| (අ) | නව මුතුවැල්ල ටොරින්ටන් උමං මාර්ගය සැලසුම් කිරීම හා ගොඩනැගීම. | 86 | 40 | 38 | මෙම ව්‍යාපෘතින් ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය , සමස්ථ ව්‍යාපෘතිය නිමකිරීම කෙරෙහි සෘජුව බලපෑමක් ඇති කිරීම නිසා ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දින දක්වා දින දීර්ඝ කිරීමට සිදුව තිබුණි. මෙම ප්‍රමාදය නිසා මෙම ව්‍යාපෘතිය තුලින් පොදු මහජනතාව වෙත ලබාදීමට ඉලක්ක කල කිසිදු වාසියක් ලබාදීමට නොහැකි වන අතර ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක වියදම් දැරීමට සිදු වීම. | (i) සමස්ථ ව්‍යාපෘතියේ ඉලක්ක කෙරෙහි ලගාවීම කෙරෙහි බලපෑමක් ඇති කරයි.<br><br>(ii) මෙමගින් මහජනතාව වෙත ලබාදීමට බලාපොරොත්තු වූ ප්‍රතිලාභ ලබාදීමට ප්‍රමාදවීම සහ ව්‍යාපෘති වියදම් ඉහල යාම. | සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමට කටයුතු කල යුතු අතර අදාල කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රශස්ථ කොන්ත්‍රාත් ඇස්තමේන්තු පිළියෙල කල යුතුයි. කොන්ත්‍රාත්තුව මඟින් ආර්ථිකමය බව, කාර්යක්ෂම බව හා ඵලදායී බව වර්ධනය කරගත හැකි පරිදි උපදෙස් හා මගපෙන්වීම් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදිය යුතුයි. | ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | කෝට්ටේ රම්පාට් ජෛව විවිධත්ව උද්‍යානය සංවර්ධනය කිරීම. | 89 | 45 | 42 | | | | |
| (ඇ) | තලංගම වැව අසල ගංවතුර පාලන පිවිසුම් ඉදිකිරීම සහ බෞද්ධාලෝක මාවත බෝක්කු (Culverts) ඉදිකිරීම. | 49 | 37 | 47 | | | | |
| (ඈ) | ශාන්ත සෙබස්තියන් උතුරු දොරටුව සහ පොම්පාගාරය සැලසුම් කිරීම හා ඉදිකිරීම | 90 | 69 | 80 | | | | |
| (ඉ) | කොලොන්නාව ඇලමාර්ග හැරවීම යෝජනා ක්‍රමය - අදියර I | 75 | 53 | 57 | | | | |
| (ඊ) | අඹතලේ ගංවතුර පොම්පාගාරය සැලසුම් කිරීම හා ඉදිකිරීම. | 84 | 73 | 25 | | | | |

**3.2 ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිමකිරීමේ ප්‍රමාදය**

| | ක්‍රියාකාරකම | සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වූ දිනය | ව්‍යාපෘතිය නිමකර භාරදුන් දිනය | වැඩ ප්‍රමාද වූ මාස ගණන | බලපෑම | විගණකගේ නිර්දේශ | කළමනාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|---|---|
| (අ) | දේවි බාලිකා විද්‍යාලය අසල කානු පද්ධතිය ඉදිකිරීම | 2017 නොවැම්බර් | 2019 සැප්තැම්බර් 03 | 21 | සමස්ථ ව්‍යාපෘතිය නිමකිරීමේ කාලසීමාව තවදුරටත් දීර්ඝ කිරීමට මෙය හේතුවක් වන අතර ඉදිකිරීමේ ප්‍රමාදය වැඩ පිරිවැය ඉහල යාමට හේතුවේ. | ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා නියමිත දින වකවානු තුල කොන්ත්‍රාත්තුවක් නිමකිරීමට අවශ්‍ය සියළුම ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | නොරිස් ඇල මාර්ගය වැඩිදියුණු කිරීම. | 2019 අගෝස්තු | 2020 සැප්තැම්බර් මස දක්වා වැඩ අවසන් කර භාරදී නැත. | 11 | | | |
| (ඇ) | මාදිවෙල නැගෙනහිර වැව වැඩිදියුණු කිරීම. | 2017 ඔක්තෝම්බර් | 2019 ජනවාරි 31 | 16 | | | |
| (ඈ) | තලංගම වැව හැරීම. | 2017 මාර්තු | 2020 සැප්තැම්බර් මස වන තෙක් වැඩ අවසන් කර භාරදී නැත. | 42 | | | |
| (ඉ) | ශාන්ත සෙබස්තියන් දකුණු දොරටුව හා පොම්පාගාරය සැලසුම් කිරීම හා ඉදිකිරීම. | 2019 ජුනි | 2020 සැප්තැම්බර් මස වන තෙක් වැඩ අවසන් කර භාරදී නැත. | 15 | | | |
| (ඊ) | මාදිවෙල නැගෙනහිර හැරවුම් අදියර III | 2018 ජනවාරි | 2020 සැප්තැම්බර් මස වන තෙක් වැඩ අවසන් කර භාරදී නැත. | 33 | | | |
| (උ) | කොලොන්නාව ඇල මාර්ග හැරවුම අදියර II | 2019 මාර්තු | 2019 මැයි 05 | 06 | | | |
| (ඌ) | බේරේ වැව දිගට උද්‍යානය (Liner Park) ඉදිකිරීම. | 2019 අප්‍රේල් | 2020 සැප්තැම්බර් මස වන තෙක් වැඩ අවසන් කර භාරදී නැත. | 17 | | | |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | බේරේ වැව දිගට උද්‍යානය ඉදිකිරීම (Liner Park) අදියර II සඳහා අනුමත ඇස්තමේන්තුවට අනුව කැනීම් සඳහා රු.1,542,790 ක් වෙන්කර තිබුණු අතර ඒ සඳහා රු.1,246,686 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශීය සභා නීති රීති අනුව, හාරන ලද පස් වැඩ බිමෙන් ඉවත් කිරීමට කටයුතු කල යුතු නමුත් අදාල කොන්ත්‍රාත්කරු එසේ කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශිය සභා නීතිරිති අනුව කටයුතු කිරිමට ව්‍යාපෘතිය වගකීමෙන් බැදෙන අතර එයට අනුකූල නොවීමෙන් පාරිසරික බලපෑමක් ඇති විය හැකිය. | ඉවත් කරන ලද පස් පසුව වෙනත් පිරවිය යුතු ව්‍යාපෘතියක් වෙත යවන ලදී. | කොන්ත්‍රාත්කරු හා ව්‍යාපෘතිය විසින් ඇතිකරගන්නා ලද ගිවිසුමේ නීතිරිති වලට දෙපාර්ශවයම අනුගත විය යුතුයි. |
| (ආ) | තලංගම වැව ආශ්‍රිත ගංවතුර පාලන පිවිසුම ඉදිකිරිමේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2020 ජනවාරි 20 දින නිම කිරිමට එකගතාවය ඇති කරගෙන තිබුණු නමුත් එය 2020 අප්‍රේල් 21 දින දක්වා දින දීර්ඝ කර තිබුණු අතර රු.6,465,070 ක් ඇස්තමේන්තු කර තිබුණු ප්‍රධාන කාර්යයන් 3 ක් ඉටුකර නොතිබුණි. ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | කොන්ත්‍රාත් කාල සීමාව තව දුරටත් දීර්ඝ කිරීමට සිදුවි තිබීම නිසා සැලසුම් කල කාල සීමාව තුල වැඩ නිමකල නොහැකි වීම. | නැවතත් 2020 ජුලි 29 දක්වා දින දීර්ඝ කරගැනීමක් සිදුකර තිබුනු බැවින් ප්‍රමාද ගාස්තු අයකල නොහැකියි. සංශෝධිත වැඩසටහනක් සංවර්ධනකරු විසින් ඉදිරිපත් කර ඇත. | මේ සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව උප ව්‍යාපෘති 27 ක 2019 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රගතිය සියයට සියයක් විය. නමුත් සංරචක 2 යටතේ පැවති උප ව්‍යාපෘති 17 ක සහ සංරචක I යටතේ පැවති උප ව්‍යාපෘති 10 ක ඇස්තමේන්තුගත පිරිවැය හා කොන්ත්‍රාත් පිරිනැම්මේ පිරිවැය අතර විචලතාවයක් නිරීක්ෂණය විය. එය සියයට 16 සිට සියයට 40 දක්වා පරාසයක පැවතුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල පිරිවැය ඉහල යාම කොන්ත්‍රාත් කළමනාකරණ ක්‍රියාවලිය කෙරෙහි සෘජුව බලපෑමක් ඇති කරයි. | 2019 දෙසැම්බර් 31 වන විට සියයට සියයක ප්‍රගතිය පෙන්වන ලද ව්‍යාපෘති සියල්ලම නිමකර තිබුණි. ව්‍යාපෘතිවල ප්‍රගතිය ගණනය කිරීම සඳහා පාදක කරගනු ලබන්නේ මූලික ඇස්තමේන්තුගත පිරිවැය වන අතර අවසන් අදියරේ එය මුල්‍ය කොන්ත්‍රාත් පිරිවැය මත ගණනය කරනු ලබයි. | ව්‍යාපෘති කොන්ත්‍රාත් ගිවිසුම අනුව පිරිවැය හා ප්‍රගතිය පාලනය කර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඈ) | ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 7,601 ක් වූ උප ව්‍යාපෘති 05 ක වර්ෂාවසානයේදී ඉලක්කගත ව්‍යාපෘති නිම කිරිමේ ප්‍රතිශතය සමග සැසදීමේදී සියයට 50කට වඩා අඩු ප්‍රතිශතයක් නිරීක්ෂණය වීම. | බලාපොරොත්තු වූ ප්‍රගතිය කරා ලගා වීමට නොහැකිවීමෙන් ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරිමට සිදුවීම. | 2019 අප්‍රේල් 21 දින ප්‍රහාරය ව්‍යාපෘති නිමකිරිමේ ප්‍රමාදයට හේතු විය. | මහජනයා වෙත වැඩි ප්‍රතිලාභ ලැබෙන පරිදි උප ව්‍යාපෘති පෙල ගස්වා ප්‍රධාන උප ව්‍යාපෘතින් නිම කිරිමට කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | කෝට්ටේ තෙත්බිම් උද්‍යානය (Kotte Rampart Wetland Park) ඉදිකිරීම්වල ප්‍රමාණ පත්‍රිකා (BOQ) අංක 139(9) අනුව කොන්ත්‍රාත්කරු විසින් මිනුම්කරුවෙකු පත්කර ගැනීම සඳහා රු.4,650,000 ක් වෙන්කර තිබුණු නමුත් එම පත්කිරීම සිදුකර නොතිබුණි. | අවශ්‍ය නොවන අයිතම BOQ තුල අන්තර්ගත කර ඇති බැවින් එම ඇස්තමේනුතුගත පිරිවැය ඉහල අගයක් ගැනීමට හේතු වීම. | මෙම තනතුරු පිරවීම සඳහා කටයුතු කරමින් පවතී. | අනවශ්‍ය අයිතම ඇතුලත් කිරීම් අධීක්ෂණය කර ඒ සඳහා ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**3.4 වැඩබිම් පරීක්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණ**

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | තලංගම වැව ඉදිකිරීමේදී ඉවත් කිරීමට සිදුවූ ගස් වෙනුවට ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් අනතුරුව පැලැටි 42 ක් සිටුවීමට සැලසුම් කර තිබුනු නමුත් එය සැලසුම් කල පරිදි සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීමෙන් පරිසරික තත්ත්වයන්ට බලපෑමක් සිදුවිය හැකිය. | කොවිඩ් - 19 කාලසීමවා බැවින් නියමිත පරිදි ක්‍රියා කිරීමට නොහැකි විය. | සැලසුම් කල පරිදි ගස් සිටුවීමට පියවර ගත යුතුයි. |
| (ආ) | ව්‍යාපෘතිය විසින් රු.මිලියන 275.8 ක් වැයකර මට්ටක්කුලිය කාක දූපතෙහි වෙරළ උද්‍යානයක් ඉදිකර 2017 වසරේදී නගර සභාව වෙත භාරදී තිබුණද වෙරළ උද්‍යානය සැලසුම් කිරීමේ දුර්වලතාවයන් හා වෙරලාශ්‍රිත ඉදිකිරීමක් සඳහා ලුනු මිශ්‍රිත ජලයට ඔරොත්තු දෙන අමුද්‍රව්‍යයන් යොදා නොගැනීම නිසා වෙරල උද්‍යානය මහජනයාට භාවිතා කල නොහැකි පරිදි එහි ඉදිකිරීම් මලකඩ කෑමට සහ දිරා යාමට ලක්වීම නිසා නැවත රු.මිලියන 39 ක් ප්‍රතිසංස්කරණය සඳහා දැරීමට සිදුව තිබුණි. | පාරිසරික බලපෑම සැලකිල්ලට නොගෙන සැලසුම් සැකසීම හේතුවෙන් ඉතා කෙටි කාලයකින් නැවත ප්‍රතිසංස්කරණය කිරීමට අමතර වියදමක් දැරීමට සිදුවීම. | ව්‍යාපෘතිය නිමකර මහජනයාට භාරදී වසර 4 කට පසුව මෙම තත්ත්වය ඇතිවී තිබුණි. | පාරිසරික බලපෑම් හා සමාජ අවශ්‍යතා හඳුනාගෙන සැලසුම්කරණය සිදුකල යුතුයි. |

**3.5 ව්‍යාපෘති අරමුණු වලට පටහැනි වියදම්**

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය නිමකිරිමට නියමිතව අවසන් අදියරේ පවතිද්දී , නිවැරදි ක්‍රම භාවිතයෙන් තොරව, තවත් කාර්යාල ඉඩකඩක් ලබාගැනීම සඳහා රු. 130,534, ක මාසික කුලියක් ගෙවීමටද රු.2,642,073 ක් කාර්යාලය බෙදා වෙන්කර ගැනීමටද වැයකර තිබුණි. | ඵල රහිත සහ අනාර්ථික වියදම වැඩි විම තුලින් ව්‍යාපෘති පිරිවැය ඉහල යාම. | පවත්නා කාර්යාල ඉඩකඩ ප්‍රමාණවත් නොවූ බැවින් මෙම කාර්යාල කොටස ලබාගන්නා ලදී. | ව්‍යාපෘති අරමුදල් ආර්ථිකමය ගණුදෙනු සඳහා භාවිතා කල යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ ගිණුම් තැබීමේ හා ව්‍යාපෘති සමාලෝචනය පරිගණක මෘදුකාංගයක් ලබාගැනීම සඳහා 2015 වසරේදී රු. 1,000,575 ක් දරා තිබුනු නමුත් අදාල 2020 ජුනි මස දක්වාම මෘදුකාංගය ස්ථාපිත කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියට අදාල මෘදුකාංගය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘතිය අවසන් අදියරේ පැවතියද අදාල මෘදුකාංගය භාවිතයෙන් ලැබීමට බලාපොරොත්තු වූ ප්‍රතිලාභය ලැබීමට ව්‍යාපෘතියට නොහැකි වි තිබීම. | විවිධ හේතුන් නිසා අදාල මෘදුකාංගමය ස්ථාපිත කිරිමට නොහැකි වී තිබුණි. | මෙවැනි වියදම් ඇති නොවීමට ක්‍රියාකල යුතුයි. |
| (ඇ) | ව්‍යාපෘතියට අදාල උප ව්‍යාපෘතියක් වන Real Time Flood Control Unit ස්ථාපිත කර පවත්වාගෙන යාම සඳහා ඇ.ඩො. මිලියන 2.6 කට සමාන රු. මිලියන 396 ක් වෙන්කර තිබුණි. මෙයින් රු. මිලියන 150.52 ක් සහ රු.මිලියන 80.76 ක් උපකරණ හා පරිගණක මෘදුකාංග මිලදී ගැනිම සඳහා වැයකර තිබුනද මෙමගින් බලාපොරොත්තු වූ ඉලක්ක කරා ලගා වීමට නොහැකි වී තිබුණි. | අදාල උප ව්‍යාපෘතිගෙන් බලාපොරොත්තු වූ ප්‍රගතියක් නොලැබීම තුලින් නිශ්කාර්ය වියදම් ඉහල ගොස් ව්‍යාපෘති පිරිවැය ඉහල යාම. | මෙම උප ව්‍යාපෘතියෙන් විශාල කාර්යභාරයක් සිදුවේ. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරිමේදී අරමුණු ඉටුකර ගැනීමට වැඩි අවධානයක් යොමුකල යුතුය. |
| (ඈ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතියෙන් තොරව සහ මාසික ගෙවීම් පදනම මත වසර 03 ක් සඳහා රු.මිලියන 37.16 ක් ගෙවා උපදේශකවරයෙකු පත්කරගෙන තිබුණි. වර්ෂාපතන අනාවැකි හා ගංවතුර පැතිරිම පිළිබඳ අධ්‍යන හා දත්ත ලැබෙන මාර්ග පවතින බැවින් ඒ සඳහා අමතර | නිශ්චිත ඉලක්කයක් නොමැතිව හා විකල්ප ක්‍රියාමාර්ග ගැන නොසලකා වියදම් දැරීම තුලින් නිශ්ඵල වියදම් වැඩිවීමට හේතු වීම. | ලෝක බැංකු උපදෙස් ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. ගිවිසුම් ප්‍රකාරව උපදේශන ගාස්තු ගෙවා ඇත. එබැවින් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබිමේ අවශ්‍යතාවයක් නොමැත. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරිමේදී අරමුණු කරා ලගාවීමේ වියදම ඵලදායි වන ක්‍රියාකාරකම් සඳහා වැඩි අවධානයක් යොමුකල යුතුය. |

පිරිවැයක් දැරීමේ අවශ්‍යතාවයක් නොමැති වුවද ඒ සඳහා කටයුතු කර තිබුනු නමුත් වර්ෂාපතනය වැඩි ස්ථාන හඳුනාගෙන එකී ස්ථානවල එක්රැස් වන ගංවතුර කඩිනමින් බැසයාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම අංශය විසින් කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි.